Good Food, Good Life

Nestlé Lanka PLC News Release
Colombo: April 04 2012

# මෙරට ආර්ථික සහ සමාජ සංවර්ධනය උදෙසා නෙස්ලේ සමාගමේ විශිෂ්ට දයකත්වය ගරු කතානායකතුමාගේ ඇගයුමට ලක් වේ.

ශ්‍රී ලංකා ජනරජයේ ගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ "මහින්ද චින්තන" ප්‍රතිපත්ති ප්‍රකාශයනයට අනුව යමින් මෙරට ආර්ථික සහ සමාජ සංවර්ධනය උදෙසා දක්වන ලද දයකත්වය වෙනුවෙන් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ගරු කතානායක චමල් රාජපක්ෂ මැතිතුමා නෙස්ලේ සමාගම වෙත ඇගයුම් සම්මානයක් පිරිනමන ලදී.

මේ පිළිබඳව තම අදහස් දක්වූ ගරු කතානායක චමල් රාජපක්ෂ මැතිතුමා මෙසේ පැවසීය. "ශ්‍රී ලංකාවේ ආයතනික වගකීම්වලදී නෙස්ලේ සැබෑම නියමුවෙක් වන අතර මෙරට ඉතාම අගනා "විශිෂ්ට ආයතනික පුරවැසියෙක්." සමාජය තුළ තිරසාර අගයක් නිර්මාණය කිරීම සඳහා ඔවුන් තුළ වන කැපවීම මෙරට කිරි නිෂ්පාදනය සංවර්ධනය කිරීම, දේශීය අමුද්‍රව්‍ය යොදා ගනිමින් දේශීය කෘෂි කර්මාන්තය සංවර්ධනය කිරීම සහ තමන් මෙහෙයුම් කරන ප්‍රදේශ තුළ පාරිසරික හානි අවම කරමන් පරිසරය රැක ගැනීම යන සාධක කෙරෙහි දක්වනු ලබන දැඩි අවධානය තුළින් මනාව තහවුරු වෙනවා."

පසුගිය සතියේ කතානායක නිල නිවසේ පැවැති හමුවකදී මෙම සම්මානය නෙස්ලේ ජාත්‍යන්තර විධායක උප සභාපති නන්දු නන්ද්කිෂෝර් මහතා වෙත ප්‍රදානය කළ අතර එම අවස්ථාව සඳහා සමාගමේ ජ්‍යෙෂ්ඨ නිලධාරීහුද සහභාගි වී සිටියහ. මීට අමතරව එම අවස්ථාව සඳහා පරිසර අමාත්‍ය ගරු අනුර ප්‍රියදර්ශන යාපා, වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකකරණ අමාත්‍ය ගරු නිමල් සිරිපාල ද සිල්වා, පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍ය ගරු ජගත් පුෂ්පකුමාර පුද්ගලික ප්‍රවාහන අමාත්‍ය ගරු සී. බී. රත්නායක, මුදල් අමාත්‍යවරයාගේ පුද්ගලික ලේකම් ශමීන්ද්‍ර රාජපක්ෂ සහ පොලිස්පති එන්. කේ. ඉලංගකෝන් යන මහත්වරු සහභාගි වූහ.

නන්දු නන්ද්කිෂෝර් මහතා නෙස්ලේ ගෝලීය විධායක මණ්ඩලයේ සාමාජිකයෙකි. ඔහු ආසියා, ඕෂනියා, අප්‍රිකා, සහ මැද පෙරදිග කලාප භාර නව ප්‍රධානියාද වේ.

නන්ද්‍ර කිෂෝර් මහතා පසුගිය සතියේ ශ්‍රී ලංකාවට පැමිණියේ සමාගම විසින් ශ්‍රී ලංකාවේ ආයෝජනය කිරීමට සැලසුම් කොට ඇති රුපියල් මිලියන 10 ක දැවැන්ත ආයෝජනයක තෙවැනි පියවර සටහන් කරමින් නව නිෂ්පාදනාගාරයක් විවෘත කිරීම සඳහා වූ අතර එමගින් මෙරට සංවර්ධනය සඳහා වන සමාගමේ කැපවීම තවදුරටත් තහවුරු වේ. The Good Food, Good Life යන්න තේමාව කොටගත් සමාගමේ තෙවන ආයෝජනය කරන ලද්දේ කුරුණෑගල පිහිටි කම්හලේ සංකීර්ණයේ නව UHT කිරි නිෂ්පාදනාගාරයක් විවෘත කිරීම වෙනුවෙන්ය.

මේ පිළිබඳව තම අදහස් දක්වමින් නන්දිකිෂෝර් මහතා මෙසේ පැවසීය. "මේ ආයෝජනය තුළින් සමාගමට මෙන්ම රටටද සිදුවන්නේ විශාල යහපතක්. අප ව්‍යාපාරික මෙහෙයුම් කරන රටවල් සඳහා දිගු කාලීන වටිනාකම් නර්මාණය කිරීම, අපේ පාර්ශ්වකරුවන් සඳහාද දිගුකාලීන වටිනාකමක් නිර්මාණය කිරීමක් වෙනවා. දුර දක්නා නුවණකින් යුතු ව්‍යාපාර සංවර්ධනයක් වගකීමකින් යුතුව කළමනාකරණය කිරීම තුළින් සැලකිය යුතු ලෙස දේශීය සමාජ, පාරිසරික හා ආර්ථික සංවර්ධනයක් ඇතිකිරීමට හැකියාව ලැබෙනවා. ශ්‍රී ලංකා රජය වෙතින් මෙම සම්මානය ලැබීම අතිශයින්ම ගෞරවයක් ලෙස නෙස්ලේ සමාගම සලකනු ලබනවා. නිරන්තයෙන්ම අප අපේ දේශීය ජනතාව සඳහා සාමූහික සාරධර්ම නිර්මාණය කිරීම සඳහා කැපවීමකින් කටයුතු කරනු ලබනවා.

ලොව විශාලතම පිටි කළ පොල්කිරි අපනයන කරු වන නෙස්ලේ ලංකා ශ්‍රී ලංකාවේ පෞද්ගලික අංශයේ විශාලතම කිරි එක්රැස් කරන්නාද වෙයි. වසරකදී සමාගම ශ්‍රී ලංකාවේ පොල් මිලියන 50,000 කට අධික සංඛ්‍යාවක් මිලදී ගන්නා අතර දිනපතා දිවයින පුරා කිරිගොවීන් 15,000 කට අධික සංඛ්‍යාවකින් කිරි එක් රැස් කරයි. එසේම සමාගම සම්ප්‍රදයික, පෝෂණීය

සංයෝග වලින් සමන්විත දේශීය රසවලින් පාරිභෝගිකයින් අතට පත්වන නෙස්ටම්, සෙරිලැක්, හා මැගී රයිස් නූඩ්ල්ස් වැනි ජනප්‍රිය නිෂ්පාදන සඳහා යොදගැනෙන සහල්, එලවලු, පලතුරු, ලුණු, හා කුළුබඩු වර්ග ආදී දේශීය අමුද්‍රව්‍ය මිලදී ගැනීමද ඉහළ නංවා ඇත.

ඉන් බැහැර තවත් ක්ෂේත්‍ර කීපයක් වෙතද සමාගම තම අවධානය යොමු කොට තිබේ. ග්‍රාමීය ප්‍රජාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීම යන දර්ශනය ඔස්සේ යමින් පෝෂණය, ජලය හා ග්‍රාමීය සංවර්ධනය යන අංශවල ගුණාත්මක බව ඉහළ නැංවීම සඳහා දරන ලද ප්‍රයත්නය වෙනුවෙන් ශ්‍රී ලංකාවේ ඉහළම ව්‍යාපාරික ගෞරවයට පාත්‍රවෙමින් ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලයෙන් " විශිෂ්ටතම ආයතනික පුරවැසියා" ලෙස සම්මානයෙන් පිදුම් ලැබීමටද සමාගම සමත්විය. තමන් ව්‍යාපාර කටයුතුවල යෙදෙන ස්වභාවය ලෙස නෙස්ලේ, සාමූහික සාරධර්ම නිරමාණකරණය යන ආකල්පයෙන් යුතුව කටයුතු කරන අතර ඉන් අරුත් වන්නේ ආයතනය සමාජ වගකීම්වලින් ඔබ්බට ගොස් තම ව්‍යාපාරයට මෙන්ම සමාගම මෙහෙයුම් කටයුතු කරන රටවල ජනතාවගේ සුබ සාධනය උදෙසාද තිරසාර හා ඒකාබද්ධ ප්‍රතිලාභයක් ලබාදීමය.

- Ends -

**වැඩිදුර තොරතුරු සඳහා විමසීම් –**


| | |
|---|---|
| සමන්තා මෙන්ඩිස්<br>ආයතනික සන්නිවේදන කළමනාකාර<br>නෙස්ලේ ලංකා PLC<br>තැ. පෙ. 189 කොළඹ / 440, ටී. බී. ජායා මාවත,<br>කොළඹ 10.<br>දුරකථනය<br>ජංගම : 077 3405154 \| සෘජු : 4794597<br>පොදු : 2 699 991 / 2 696 304, දිගුව: 524 \|<br>**ෆැක්ස්** : 5330044<br>samantha.mendis@lk.nestle.com | දමිත කුලතුංග<br>ආයතනික පොදු කටයුතු කළමනාකාර<br>නෙස්ලේ ලංකා PLC<br>තැ. පෙ. 189 කොළඹ / 440, ටී. බී. ජායා මාවත,<br>කොළඹ 10.<br>දුරකථනය<br>ජංගම: 077915949 \| සෘජු : 4794597<br>පොදු: 2 699 991 / 2 696 304, දිගුව: 540 \|<br>**ෆැක්ස්:** 5330044<br>damitha.kulatunga@lk.nestle.com |